| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **ශ්‍රවණය** | | |
| 1.0 එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථා හා සිද්ධි ඇසුරෙන් කෙරෙන කතාබහට අවධානයෙන් හා අවබෝධයෙන් සවන් දී නිසි ප්‍රතිචාර දක්වයි. | 1.1 නිවසේ දී හා පොදු ස්ථානවල දී අසන හා ඇසෙන කතාබහට අවධානයෙන් සවන් දී ප්‍රතිචාර දක්වයි. | ♣ පන්ති කාමරයේ දී ගුරුවරුන් හා සිසුන් අතර නිතර ඇතිවන කතාබහ<br>උදා :<br>- සිසුවකු දින කිහිපයක් පන්තියට නොපැමිණීම.<br>- පන්තිකාමරය හා අවට පරිසරය පිරිසිදු ව තබා ගැනීම.<br>- නව පන්ති නායකයාට සුබ පැතීම. |
| 2.0 නිවේදන, විධාන, පණිවිඩ, අවවාද, උපදෙස්වලට අවබෝධයෙන් හා අවධානයෙන් යුතු ව සවන් දී අවස්ථාවොචිත ව ප්‍රතිචාර දක්වයි. | 2.1 විවිධ ස්ථානවල දී අසන්නට ලැබෙන විධාන නිවේදනවලට ප්‍රතිචාර දක්වයි. | ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ප්‍රජාව වෙත කෙරෙන නිවේදනවලට සවන් දී වාග්කෝෂය පුළුල් කර ගනිමින් ප්‍රතිචාර දැක්වීම. (පන්ති මට්ටමට අදාළ ලෙස) |
| 3.0 දෙබස්, සංවාද හා සාකච්ඡා ආදියට සවන් දී අනුකරණාත්මක ව නිසි අවස්ථාවල දී භාවිත කරයි. | 3.1 සංවාද සාකච්ඡාවලට ඇහුම්කන් දෙමින් හා ඒවාට සහභාගි වෙමින් අදහස් දක්වයි. | ♣ බස් නැවතුම්පොළ, රෝහල වැනි ස්ථානවල දී ඇසෙන්නට ලැබෙන දෙබස් සංවාද<br>උදා :<br>- රෝහලේ දී වෛද්‍යවරයා හා රෝගියා අතර ඇති වූ සංවාද<br>- රෝගීන් කිහිප දෙනෙකු අතර තොරතුරු විමසීම.<br>♣ බස් රථයේ ප්‍රමාදය.<br>♣ බසය අද ධාවනය නොවීම පිළිබඳ ව දෙදෙනෙකු අතර අදහස් හුවමාරු කිරීම.<br>♣ දිවා ආහාරය සඳහා යාළුවෙකුගේ නිවසට යාම සඳහා දින වේලාව පිළිබඳ කතාබහ |
| 4.0 කවි හා ගීතවලට සවන් දී ගායනය කරයි. | 4.1 කවි හා ගීත ගායනා කරමින් රස විඳියි. | ♣ ප්‍රශ්න හා පිළිතුරු ලෙස ඉදිරිපත් වන සරල තේරවිලි කවි රස විඳීම<br>♣ සවන් දී ගායනය<br>♣ අර්ථ රසය වටහාගෙන<br>උදා:<br>"ගසට නමකි ගස මැරුණම වෙන නමකි" |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **ශ්‍රවණය** | | |
| 5.0 කතන්දරයකට සවන් දී මතකයෙන් කියයි. | 5.1 කතන්දරයකට සවන් දී එය කෙටියෙන් කියයි. | කතන්දරයකට සවන් දීම හා ප්‍රධාන සිද්ධි හා අවස්ථා ඉදිරිපත් කිරීම<br>උදා:<br>- අන්දරේගේ කතා<br>- මහදැනමුත්තාගේ කතා |
| 6.0 විවිධ ප්‍රවෘත්තිවලට හා කතාවලට සවන් දී වැදගත් කරුණු ප්‍රකාශ කරයි. | 6.1 ගුවන්විදුලි හා රූපවාහිනී ප්‍රවෘත්තිවලට අවධානයෙන් සවන් දී සිත් ගත් යමක් අන්‍යයන්ට කියයි. | ♣ ප්‍රවෘත්ති<br>- ළමා පුවත්<br>- දේශීය පුවත්<br>- විදේශීය පුවත් |
| **කථනය** | | |
| 7.0 ආචාරශීලී ව සංයමයෙන් යුතු ව කතාබහේ යෙදෙයි. | 7.1 සංයමයෙන් යුතුව ප්‍රිය වචන භාවිත කරමින් කතා කරයි. | ♣ පොදු ස්ථානවල දී විවිධ පුද්ගලයන් සමග කරන කතාබහ<br>උදා:<br>- දුම්රියපොළ<br>- කඩපොළ<br>- මගතොට<br>- වෙළෙඳපොළ |
| 8.0 වචන සකසුරුවම් ලෙස භාවිත කරමින් අත්දැකීම් හා සිද්ධි විස්තර කරයි. | 8.1 තමා ඇසූ දුටු දෙයක් කෙටියෙන් කියයි. | ♣ තමා අත්දුටු සිද්ධියක්<br>උදා:<br>- විභාග ප්‍රතිඵල නිකුත් වූ දා<br>- ප්‍රමාද වී පාසලට පැමිණීම<br>- යහළුවන් සමග විනෝද වූ දිනක්<br>- කෙනෙකුට උදවු කළ අවස්ථාවක්"<br>- අම්මා සමග මගුල් ගෙදරට ගිය අවස්ථාවක්<br>- ගංවතුරේ ඔරුපදින්නට ගොස් බේරුණු හැටි. |
| 9.0 විවිධ මාතෘකා යටතේ කතා කරයි. | 9.1 වචන වාක්‍යාංශ හා වාක්‍ය නිවැරදි ව භාවිත කරමින් මාතෘකාවට අදාළ ව කතා කරයි. | ♣ සරල මාතෘකාවක් යටතේ කෙටි වාක්‍ය කීපයක් පැවසීම.<br>උදා:<br>- අපේ අලුත් ගුරුතුමා<br>- මගේ පොඩි නංගි<br>- සරුංගලය සුළඟට ගසාගෙන ගියා |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 10.0 එදිනෙදා කටයුතු හා බැඳුණු කතාබහේ යෙදෙයි. | 10.1 සමිති සමාගම් හා උත්සවවලට සහභාගි වෙමින් අදහස් ඉදිරිපත් කරයි. | ♣ තර්කානුකූල ව තම අදහස් ප්‍රකාශ කිරීම<br>උදා:<br>- කතාවක් පැවැත්වීම<br>- සාකච්ඡා<br>- පාසල් කථික තරග<br>- වාද විවාද |
| **කියවීම** | | |
| 11.0 සිංහල අක්ෂර මාලාව හඳුනාගනිමින් එහි විවිධතා අවබෝධ කරගෙන නිසි උච්චාරණයෙන් යුතු ව ලිපි ලේඛන කියවයි. | 11.1 ශබ්ද හා අක්ෂර භේද හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කරමින් වචන වාක්‍යාංශ හා වාක්‍ය කියවයි. | ♣ පැහැදිලි ව ශබ්ද නගා කියවීම මූර්ධජ 'ෂ' තනි ව යෙදෙන වචන ඇතුළත් වාක්‍යාංශ.<br>උදා:<br>- භාෂාව, විශේෂ, රක්ෂණය, වර්ෂාව, වර්ෂය, භික්ෂුව, ආරක්ෂාව, ලක්ෂණය<br>- භික්ෂූන් වහන්සේලා පස් නමක් වඩිනවා.<br>- සිංහල දෙමළ භාෂා ඉගෙන ගැනීම අපිට හරි ම ප්‍රයෝජනවත් |
| | 11.2 විවිධ වාක්‍ය රටා ඇතුළත් අර්ථවත් කෙටි සිද්ධියක් හෝ සංවාදයක් හෝ පැහැදිලි ව හා නිවැරදි ව ශබ්ද නගා කියවයි. | ♣ විවිධ විෂයානුබද්ධ වචන ඇතුළත් ලේඛන<br>- විද්‍යා ප්‍රබන්ධ |
| 12.0 අදහස් ග්‍රහණය කර ගැනීම සඳහා විවිධ ලේඛන කියවයි. | 12.1 අක්ෂර වින්‍යාසය, පද බෙදීම, විරාම ලක්ෂණ ආදිය කෙරෙහි සැලකිලිමත් වෙමින් පැහැදිලි ව නිවැරදි ව වාක්‍ය හා ඡේද කියවයි. | මහාප්‍රාණ අකුරු සහිත වචන ඇතුළත් ලේඛන කියවීම (ඝ, ඡ, ඨ, භ) |
| | 12.2 මූලික තොරතුරු හා අදහස් ලබා ගැනීම සඳහා අවබෝධයෙන් යුතුව විවිධ ලේඛන හා නිර්මාණ කියවයි. | ♣ ළමා පුවත්<br>♣ පාසල් පන්ති සඟරා<br>♣ බිත්ති පුවත්පත් |
| | 12.3 ප්‍රධාන කරුණු අවබෝධ කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛන, සරල ගද්‍ය පාඨ, පද්‍ය පන්ති, ගීත අවබෝධයෙන් යුතු ව කියවයි. | ♣ විවිධ මාතෘකා යටතේ ලියවුණු ලිපි හා වාර්තා.<br>- ළමා ලිපි<br>- ජනකවි<br>- ජනකතා<br>- ළමා කවි, කතන්දර, ළමා ගීත |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 13.0 කවි හා ගීත කතන්දර ආදි සාහිත්‍යාංග කියවා රස විඳියි. | 13.1 සරල කවි, හා ගීත තාලානුකූල ව කියවමින් රස විඳියි. | ♣ සාර්ථක නිර්මාණ අගය කිරීම.<br>උදා:<br>- හඳහාමි<br>- ගඟ |
| | 13.2 කතන්දර, ළමා නාට්‍ය ආදිය අවබෝධයෙන් යුතු ව කියවා රස විඳියි. | ♣ උපහාසය දනවන<br>**ළමා කතා**<br>උදා:<br>- කැවුම් අප්පුගෙ ලේන්සුව<br>**ළමා නාට්‍ය**<br>උදා:<br>- කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව<br>- මඟුල්කෑම<br>- නරිබෑනා (කොටසක්) |
| 14.0 සිංහල සංස්කෘතිය හා ජාතික උරුමය හඳුනා ගැනීම හා අගය කිරීම සඳහා අදාළ ලිපි ලේඛන, කවි හා ගීත කියවයි. | 14.1 සහජීවනයට හේතුවන විවිධ උත්සව ආදි සංස්කෘතිකාංග සාරධර්ම හා ජීවන රටා පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන කියවයි. | ♣ ඉතිහාසඥයන්, භාෂාඥයන් හා සාහිත්‍යධරයන්ගේ චරිතාංගුවක් ඇතුළත් රසමුසු සිද්ධි හා අවස්ථා සහිත කෙටි නිර්මාණයක්.<br>උදා:<br>- ආනන්ද කුමාරස්වාමි<br>- සෙනරත් පරණවිතාන<br>- එස්. මහින්ද හිමි<br>- මාර්ටින් වික්‍රමසිංහ |
| | 14.2 මෙරට ස්වාභාවික සම්පත් දායාද සංස්කෘතික උරුමය හඳුනා ගනිමින් ඒවායේ අගය වටහා ගැනීම සඳහා අදාළ පුවත් පත්, සඟරා සහ බාහිර පොත පත කියවයි. | ♣ සිංහල සිරිත් විරිත් හා උත්සව,<br>♣ දේශාභිමානී කතාවක්<br>- වීර පුරන්අප්පු<br>- කැප්පෙටිපොල<br>- මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි<br>- ආනන්ද සමරකෝන්<br>(චරිතවල සිත්ගත් අවස්ථා හා සිද්ධි) |
| **ලිවීම** | | |
| 15.0 සිංහල අකුරුවල සම්මත රටා හඳුනාගෙන ලියයි. | 15.1 සිංහල අකුරුවල දිසාව, හැඩය, ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ලියයි. | 'ෆ' අක්ෂරය සහිත වචන භාවිත කරමින් වාක්‍ය ලිවීම. |
| 16.0 අක්ෂර වින්‍යාසය නිවැරදි ව යොදමින් වචන ගළපා වාක්‍ය ලියයි. | 16.1 න, ණ, ල, ළ ශ, ෂ, ස අකුරු යොදමින් වචන ලියයි. | ♣ න, ණ, ල, ළ ශ, ෂ, ස අකුරු සුදුසු පරිදි වචනවල යෙදීම<br>උදා:<br>- 'පිළි' යන්නෙහි 'ළ' මූර්ධජ බව<br>- මූර්ධජ 'ෂ' යෙදෙන වචන විෂය, පරුෂ, භාෂාව, වර්ෂාව, විෂම, අක්ෂර, පුරුෂයා, පක්ෂය, විපක්ෂය, සන්තෝෂය, භීෂණ, විෂ, ශබ්දකෝෂය. |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|
| | | - තාලුජ 'ශ' යෙදෙන වචන<br>උදා:<br>දර්ශන, අශ්වයා, ප්‍රශ්න, විශාල, සංශෝධන, අංශය, ශාලාව, බාලාංශය. |
| | 16.2 මහාප්‍රාණ අකුරු නිවැරදි ව යොදමින් වචන ලියයි. | මහප්‍රාණ අක්ෂර නිවැරදි ව වචනවල යොදයි.<br>උදා:<br>ලේඛනය, ඡායාව, පාඨශාලාව, රථය, වර්ධනය, ඵලය, විභාගය වැනි වචන |
| 17.0 සම්මත භාෂා රටාවලට අනුකූල ව අර්ථවත් වගන්ති වාක්‍ය හා ඡේද ලියයි. | 17.1 මාතෘකාවට අදාළ ව අදහස් පැහැදිලි ව ලියයි. වාක්‍ය ලියයි. | ♣ සිද්ධියකට හෝ අවස්ථාවකට අදාළ ව වාක්‍ය ලිවීම. |
| | 17.2 වාක්‍යයක උක්තය සහ ආඛ්‍යාතය හඳුනා ගනිමින් උක්තයට අනුව ආඛ්‍යාතය ගළපා වාක්‍ය නිර්මාණය කරයි. | ♣ ආඛ්‍යාත පදයට ගැළපෙන උක්ත පදය යොදා වාක්‍ය සම්පූර්ණ කිරීම.<br>උදා:<br>- මම පොත බලමි<br>- නංගී පාසල් ගියා ය.<br>- මිනිසා පාරේ යයි. |
| | 17.3 ඒකවචන, බහුවචන නාම පද සුදුසු පරිදි වාක්‍යවල යොදයි. | ♣ බහුවචන නාමපද නිවැරදි ව වාක්‍යවල යොදයි.<br>උදා:<br>- ළමයි සින්දු කියති<br>- අපි වැවට ගියෙමු<br>- ගස් සුළඟට සෙලවේ<br>- මල් පරවී වැටෙයි. |
| | 17.4 ලියන සිංහලයෙහි යෙදෙන ප්‍රාණවාචී, අප්‍රාණවාචී හා අනියමාර්ථ නාම පදවල උක්ත අනුක්ත භේදය වටහාගෙන ලියයි. | ♣ උක්ත අනුක්ත පද යොදා සරල වාක්‍ය ලිවීම<br>උදා:<br>- දරුවෙක් ගී ගයයි<br>- කෙල්ල දරුවෙකු නළවයි |
| | 17.5 ක්‍රියා පද හඳුනා ගනිමින් ඒවා වාක්‍යවල නිවැරදි ව භාවිත කරයි. | ♣ මිශ්‍ර ක්‍රියා පද වාක්‍යවල යෙදීම.<br>උදා:<br>- නංගී සින්දු කියමින් නටයි.<br>- නංගී සිංදු කිය කියා නටයි. |
| 18.0 විවිධ පද, උපමා රූපක හා භාෂා ව්‍යවහාර භාවිත කරමින් ලියයි. | 18.1 සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද හඳුනාගෙන ලියයි. | ♣ සමානාර්ථ පද නිවැරදි ව යෙදීම.<br>♣ පදවලට සුදුසු විරුද්ධාර්ථ පද අර්ථවත් ව වාක්‍යවල යෙදීම. |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
| --- | --- | --- |
| | 18.2 යුගල පද හා සමූහාර්ථවාචී පද සුදුසු පරිදි වාක්‍යවල යොදයි. | ♣ සුදුසු යුගල පද යොදා අර්ථවත් වාක්‍ය ගොඩ නැගීම.<br>උදා:<br>- **එච්චර අගහිඟකම්** නම් පේන්නෙ නැනේ<br>- **යනඑන** කොට දුනෙගන්නට බැරියැ අපූරුව |
| | 18.3 විශේෂණ පද උචිත පරිදි යොදා වාක්‍ය ලියයි. | ♣ ක්‍රියා විශේෂණ පද හා නාම විශේෂණ පද වාක්‍යවල යොදා ලිවීම.<br>උදා:<br>- අපේ අම්මා මට හරි ම ආදරෙයි.<br>- ඒ පොත නැති වුණ එක මට ලොකු පාඩුවක්.<br>- පොඩි මාමා පාර දිගේ සෙමින් යයි. |
| | 18.4 නිපාත පද වාක්‍යවල මුල, මැද, අග යොදා ලියයි. | ♣ නිපාත පද යොදා අර්ථවත් වාක්‍ය ලිවීම.<br>උදා:<br>- අනේ! මමත් එනවා.<br>- මම ඔබ සමඟ එනවා.<br>- නිමලුත් ඒවි. වැනි වාක්‍ය |
| 19.0 පද බෙදීම හා විරාම ලක්ෂණ පිළිබඳව සැලකිලිමත්වෙමින් රචනා ලියයි. | 19.1 විරාම ලකුණු සුදුසු ස්ථානවල යොදයි. | ♣ ප්‍රශ්නාර්ථ ලකුණ හා හර්ෂා දී ලකුණ සුදුසු පරිදි වාක්‍යවල යෙදීම.<br>උදා:<br>- ඔයා උදේට කෑම කෑවා ද?<br>- අයියෝ ! ඒ දරුවාට අසනීපයි |
| | 19.2 පද බෙදීම හා විරාම ලක්ෂණ ගැන සලකමින් අදහස් නිරවුල් ව හා පැහැදිලි ව ඉදිරිපත් කරමින් වාක්‍ය හා ඡේද ලියයි. | ♣ නිර්මාණාත්මක ව ලිවීම |
| 20.0 එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛන කටයුතුවල යෙදෙයි. | 20.1 සම්මත ආකෘතිවලට අනුව පෞද්ගලික ලිපි ලියයි. | - පෞද්ගලික ලිපි |
| 21.0 ලේඛනයක් කියවා අවබෝධ කර ගෙන අදහස් සාරාංශ කර ලියයි. | 21.1 ප්‍රධාන කරුණු මතුකරගෙන සටහන් කරයි. | උදා:<br>- පුවත්පත් වාර්තාවක්<br>- දැන්වීමක්<br>- ලිපියක්<br>- ආකෘති පත්‍රයක් |